ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BDU/E/PS/HP/2022/10

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 අගෝස්තු 01 දින.

ජාතික විගණන උප කාර්යාලය
මහා නගර සභාව
බදුල්ල.

සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

**හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ආර්.ජී.හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත:- පළාත් පාලන කොමසාරිස්, ඌව පළාත.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BDU/E/PS/HP/2022/10
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022 ජුනි 07 දින.

ජාතික විගණන උප කාර්යාලය

මහා නගර සභාව

බදුල්ල

සභාපති,

හපුතලේ ප්‍රාදේශීය සභාව.

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

(i) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 7,398,432 ක් වුවද, මූල්‍ය හා මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ රු. 10,805,315 ලෙසට ආදයම රු. 3,406,883 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් මෙහෙයුම් අතිරික්තය සහ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ii) දෙසැම්බර් 31 දිනට හිඟ හිටි උසාවි දඩ ආදායම රු.1,710,625 ක් වුවද, මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ රු.2,089,406 ක් ලෙසට රු. 378,781 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිග්‍රහන ලේඛනය අනුව පුස්තකාල පොත් මිල දී ගැනීම් සහ පරිත්‍යාග රු.179,087ක් වුවද, රු.152,228 ක් ලෙසට ගිණුම් ගත කිරීම නිසා රු.26 ,859 කින් පුස්තකාල පොත් ගිණුමේ ශේෂය සහ ප්‍රාග්ධන යෙදවුමෙන් ආදායමට දායක වීමේ ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) <u>නොසැසඳීම්</u>

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 04 කට අදාළව මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ හා උපලේඛන අනුව ශේෂය රු රු.507,216 ක් නොසැසඳුනි.

(ඇ) <u>විගණනයට සාක්ෂි නොවීම</u>

රු.83,187,169 ක ඉඩම් හා ගොඩනැගිලි අයිතම 64 ක් සහ තැන්පතු ශේෂය සනාථ කිරීම සඳහා ඔප්පු, පිඹුරුපත්,පැවරුම් නියෝග,විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් |
|---|---|---|---|---|
| (අ) | | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| | (i) | 134 (1) වගන්තිය | - | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි. |
| | (ii) | 158 වගන්තිය | 2,176,722 | සභාවේ වරිපනම් බදු ඒකක 735 ක් හඳුනාගෙන ගාස්තු අය කරමින් තිබුණු අතර, 2013 වර්ෂයේ සිට මේ දක්වා හිඟ වරිපනම් බදු අය කරගෙන නොතිබුණි. |
| (ආ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති | 85,878 | ස්ථාන මාරුවී ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ඇපකරුවන්ගෙන් හිඟ ණය ශේෂ අය කරගත යුතු වුවද, සේවකයින් 14 දෙනෙකුගෙන් 2013 වර්ෂයේ සිට පැවත එන සේවක ණය ශේෂ අය කරගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2009 සැප්තැම්බර් 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF-437 හි 3 ඡේදය | 174,621 | වාහන රක්ෂණාවරණයක් ලබා ගැනීමේදී නියෝජිතයින්ගේ සේවය ලබා නොගෙන සෘජුවම රක්ෂණාවරණය ලබාගත යුතු වුවද, සභාවට අයත් වාහන 03 ක් සඳහා රක්ෂණාවරණය අලුත් කිරීමට රක්ෂණ නියෝජිත සේවය ලබාගෙන තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,059,168 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,802,170 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,256,998 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2021 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 1,562,934 | 1,767,070 | 653,598 | 2,036,639 | 1,563,024 | 1,563,024 | 1,102,192 | 460,832 |
| (ii) | කුලී | 2,225,640 | 3,874,454 | 2,169,525 | 908,459 | 1,770,526 | 1,770,526 | 1,949,038 | නැත |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,154,700 | 916,370 | 915,870 | - | 700,000 | 700,000 | 722,145 | නැත |
| (iv) | වෙනත් ආදායම් | 15,108,200 | 15,206,632 | 5,720,717 | 12,861,136 | 16,361,700 | 16,361,700 | 12,113,811 | 4,247,889 |
| | එකතුව | 20,051,474 | 21,764,526 | 9,459,710 | 15,806,234 | 20,395,250 | 20,395,250 | 15,887,186 | 4,708,72[illegible] |

සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස රැස්කළ ආදායම සියයට 43.46 ක් වැනි පහළ මට්ටමක පැවති අතර,එම හේතුව මත ඉකුත් වසර අවසානයේ මුළු හිඟ ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂ අවසානයේ පැවති මුළු හිඟ ආදායම සියයට 335.68 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

2.2.2 වරිපනම් බදු

වසර 02 කට අධික කාලයක සිට පැවත එන, හිඟ හිටි වරිපනම් බදු රු.389,786 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි.

2.2.3 හිඟ වාහන බදු

වසර 02 කට අධික කාලයක සිට පැවත එන, හිඟ හිටි වාහන බදු රු. 196,300 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.2,089,406 ක් සහ මුද්දර ගාස්තු රු.9,429,358 ක් අය කරගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ

3.2 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යය මණ්ඩලය තුළ තනතුරු 03 කට අදාලව, පුරප්පාඩු 03 ක් පුරවා නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සභාව විසින් ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා බදුකරුවන් 61 දෙනෙකුට කඩ කාමර 54 ක් බදුදී තිබුණු අතර, වසර 02කට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි කඩ කාමර කුලී රු.670,562 ක් අය කරගෙන නොතිබුණි.

(ආ) 2016 මැයි 01 වන දින සිට 2017 අප්‍රේල් 30 දක්වා වූ බදු කාලයක් සඳහා ගව මස් වෙළඳසැල මසකට රු.102,702 කට බදු දීමට ගිවිසුමකට එළඹ තිබුණු අතර,ගිවිසුමේ සඳහන් කොන්දේසි අංක 03 සහ 04 අනුව සභාව කටයුතු නොකිරීම හේතුවෙන් හිඟ බදු මුදල රු.145,283 ක් අය කරගෙන නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වාහන උපයෝජනය

(අ) (i) සභාවේ කසළ අංගනයට ගෙනවිත් දමන කසළ තල්ලු කිරීම සඳහා සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය පැය 73 ක් යෙදවූ බවටත්, එසේම ඒ සඳහා ඩීසල් ලීටර් 620.5 ක් වැය වූ බවට ධාවන සටහනෙහි සඳහන් කර තිබුණද, කසළ අංගනයේ පවතින ලොග් සටහන් පොත අනුව දින 04 ක් පමණක් බැකෝ ලෝඩර් යන්ත්‍රය කසළ අංගනයේ සේවයේ යොදවා තිබූ බව තහවුරු වීම මත අදාල වාහනයේ දෛනික ධාවන සටහන් නිවැරදිව පවත්වාගෙන ගොස් නොමැති බවත් සාවද්‍ය සටහන් ඇතුළත් කර ඇති බව තහවුරු වේ.

(ii) ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල විවිධ ව්‍යාපෘති වල කාර්යයන් සඳහා 2021 ජනවාරි සිට 2021 ඔක්තෝබර් 31 දක්වා සභාව සතු ජේ සී බී යන්ත්‍රය පැය 77.4 ක් යොදවාගෙන තිබූ අතර, ඒ සඳහා සභා අරමුදලින් ඩීසල් ලීටර් 657.9 ක් සඳහා මුදල් වැය කර තිබුණද, සභාව විසින් කළ ව්‍යාපෘති වල ඇස්තමේන්තු සකස් කර, සභා අනුමැතිය ලබාගෙන නොතිබීමෙන් සභාවට රු.193,500 ක ආදායමක් අහිමිවී තිබුණි.

(ආ) 2010 ජනවාරි 08 දින දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදලින් ප්‍රාදේශීය සභාව මයික්‍රෝ කැබ් රථයක් මිලදී ගෙන තිබුණි.කැබ් රථය වසර හත හමාරක කාලයක් ධාවනය කර තිබුණු අතර, 2019 ජුනි 21 දින පළාත් යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශය අනුව කැබ් රථය අලුත්වැඩියා කටයුතු සඳහා මයික්‍රෝ කාර් ලිමිටඩ් ආයතනයට ආපදා රථයෙන් රැගෙන ගොස් ආපසු ගෙන ඒම වෙනුවෙන් රු.65,664 ක ගාස්තුවක් සභාව ගෙවා තිබුණි. එමෙන්ම 2021 අගෝස්තු 09 දින අලුත්වැඩියා කටයුතු සිදු නොකර කැබ් රථය නැවත ප්‍රාදේශීය සභාවට ගෙනවිත් තිබුණු අතර, 2021 දෙසැම්බර් 02 විගණන දිනට වසර 02 කට වැඩි කාලයක් ගතවී තිබුණද, සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව නිෂ්කාර්යව නියෝජිත ආයතනයේ හා කාර්යාල භූමියේ ගාල් කර තිබුණි. එමෙන්ම ආපදා රථයට ගෙවූ මුදල නිෂ්ඵල වියදමක් විය.

3.4.2 විධිමත් ලේඛන පවත්වා නොගැනීම

ප්‍රාදේශීය සභාවට අයත් රු.3,390,179 ක වටිනාකම ඇති ට්‍රැක්ටර් හා ට්‍රේලර්, ජල බවුසරය, බැකෝ යන්ත්‍රය,බොබ් කැට් යන්ත්‍රය හා කොම්පැක්ටර් රථය එක් එක් දිනවල සභාවේ කටයුතු හා බාහිර කටයුතු සඳහා කුලී පදනම මත සේවයේ යෙදවා ගැනීම පිළිබඳ ලේඛන කිසිවක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, කුලී පදනම මත වාහන ලබාදීමෙන් උපයාගත් ආදායමේ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැක. කෙසේ වුවද,බැකෝ යන්ත්‍රය,කොම්පැක්ටර් රථය හා ට්‍රැක්ටර් රථ සඳහා පමණක් වර්ෂය ඇතුළත රු.918,000 ක අලුත්වැඩියා හා රක්ෂණ වියදම් දරා තිබුණි. එසේම ලේඛනගතව පවතින තොරතුරු අනුව සභාව සතු බැකෝ යන්ත්‍රය, ට්‍රැක්ටර් රථය, කොම්පැක්ටර් රථය හා බොබ් කැට් යන්ත්‍රය සඳහා වර්ෂය තුළ ඉන්ධන ලීටර් 6259 ක් සඳහා සභා අරමුදලින් මුදල් වැය කර තිබුණි.

4. <u>ශ්‍රේණිගත කටයුතු භාවය හා යහපාලනය</u>

<u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කල ආදායම් හා වියදම්,වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 21 සිට සියයට 100 දක්වාද, වියදම් විෂයයන් 04 ක සියයට 21 සිට සියයට 234 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

ආර්.ජී.හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත - පළාත් පාලන කොමසාරිස්, ඌව පළාත.